# දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

## බුද්ධ චරිතය

### 04 වන පාඩම; බුද්ධ කාලීන භාරතීය ආගමික හා දාර්ශනික පසුබිම.

**[[ 2020/2021/2022/2023 ]]** 02 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ ජීවත්වූ ෂට් ශාස්තෘවරුන් අතුරින් නිගණ්ඨනාථ පුත්ත හැර වෙනත් හතර දෙනෙකු නම් කරන්න.

II නිගණ්ඨනාථ පුත්ත ශාස්තෘතුමාගේ ඉගැන්වීමෙහි ඇතුළත් චතුයාම සංවරය ලියා දක්වන්න.

III බ්‍රාහ්මණ ධර්මයට එරෙහිව පැන නැගුණු ශ්‍රමණ සම්ප්‍රදාය විසින් ප්‍රතික්ෂේප කරන ලද බ්‍රාහ්මණික ඉගැන්වීම් දෙකක් විචාරයට ලක් කරන්න.

IV බුද්ධ කාලීන භාරතයේ පැවති මහාතිත්ථායතන සූත්‍රයේ සඳහන් දාර්ශනික මතවාද තුන විචාරයට ලක් කරන්න.

**[[ 2019/2020 ]]** 03 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ පැවති දර්ශනවාද පිළිබඳ තොරතුරු සඳහන් වන සූත්‍ර දේශනා හතරක් නම් කරන්න.

II බුද්ධ කාලීන භාරතයේ පැවති දෙසැටක් මිථ්‍යාදෘෂ්ටිවාද අතුරින් හතරක් ලියා දක්වන්න.

III බුද්ධ කාලීන භාරතයේ දාර්ශනික පරිසරයෙහි නිරන්තරව පැවති ‘දස අව්‍යාකෘත ප්‍රශ්න’ කෙටියෙන් හඳුන්වන්න.

IV දස අව්‍යාකෘත ප්‍රශ්න පිළිබඳව බුදුන්ගේ විචාරය කෙටියෙන් විස්තර කරන්න.

**[[ 2018/2019 ]]** 03 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ ශ්‍රමණ සම්ප්‍රදාය නියෝජනය කළ නිගණ්ඨ සාධුවරයන් හඳුන්වන දෙයාකාරය හා එසේ හැඳින්වීමට හේතු පෙන්වා දෙන්න.

II නිගණ්ඨ සාධුවරයන් අත්ථකිලමතානුයෝගයෙහි යෙදෙමින් අනුගමණය කළ විවිධ ව්‍රත චර්යා අතුරින් හතරක් ලියා දක්වන්න.

III නිගණ්ඨනාථපුත්ත ශාස්තෘතුමාගේ ‘චතුයාම සංවර සීලය’ ලියා දක්වා, කේවලත්වය නම් විමුක්ති සුවය ලැබීමට එම ඉගැන්වීම හේතුවන අයුරු පෙන්වා දෙන්න.

IV අත්ථකිලමතානුයෝගය නිර්වාණයට මග නොවේ යැයි බැහැර කළ සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ අනුගමනය කළ ධර්ම මාර්ගය කෙටියෙන් විස්තර කරන්න.

**[[ 2017/2018 ]]** 04 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතීය ආගමික කණ්ඩායම් හතරක් නම් කරන්න.

II බුද්ධ කාලීන භාරතයේ ජීවත්වූ ආගමික ඉගැන්වීම් ඉදිරිපත් කළ ෂට් ශස්තෘවරුන් අතරින් හතර දෙනෙකු නම් කරන්න.

III අමරා වික්ඛෙපවාදියෙකු වූ සංජය බෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයාගේ ඉගැන්වීම් කෙටියෙන් විස්තර කරන්න.

IV අන්තවාද හා දෘෂ්ටිවාද බැහැර කරන බුදු සමය සත්ත්වයාගේ විමුක්තිය සඳහා පෙන්වා දෙන ධර්ම මාර්ගය පැහැදිලි කරන්න.

## [[ 2015/2016 ]] 03 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ පැවති දෙසැටක් දෘෂ්ටිවාද අතුරින් වාදවර්ග හතරක් නම් කරන්න.

II චූළමාලුඞ්ක්‍යපුත්ත සූත්‍රයේ එන දස අව්‍යාකෘත ප්‍රශ්න අතුරින් හතරක් ලියා දක්වන්න.

III ෂට් ශාස්තෘවරුන් අතුරින් මක්ඛලී ගෝසාල ශාස්තෘතුමාගේ ඉගැන්වීම් කෙටියෙන් පෙන්වා දෙන්න.

IV බුද්ධකාලීන භාරතයේ පැවති ශාස්වත හා උච්ඡේදවාද ප්‍රතික්ෂේප කරන බුදුසමය කවර ධර්ම මාර්ගයක් නිර්දේශ කරන්නේ දැයි විචාරයට ලක් කරන්න.

## [[ 2014/2015 ]] 03 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ බ්‍රාහ්මණ පූජකයින් විසින් සිදු කරනු ලැබූ යාග ක්‍රම හතරක් නම් කරන්න.

II බුද්ධ කාලීන භාරතයේ ශ්‍රමණ පූජකයින් අතින් විවේචනයට ලක් වූ බ්‍රාහ්මණ සම්ප්‍රදායට අයත් ඉගැන්වීම් හතරක් කෙටියෙන් හඳුන්වන්න.

III නිගණ්ඨනාථපුත්ත ශාස්තෘතුමාගේ චතුයාම සංවර ශීලය කෙටියෙන් විස්තර කරන්න.

IV බුදුසමයේ කර්මය පිළිබඳ ඉගැන්වීම පූරණ කස්සප ශාස්තෘතුමාගේ අකිරියවාදයෙන් වෙනස්වන අයුරු පෙන්වා දෙන්න.

## [[ 2013/2014 ]] 03 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ ජීවත්වූ ශ්‍රමණ කණ්ඩායම් හතරක් නම් කර්න්න.

II එකළ ජීවත්වූ ෂට් ශාස්තෘවරුන් නම් කරන්න.

III නිගණ්ඨනාථපුත්ත ශාස්තෘතුමාගේ ඉගැන්වීම් කෙටියෙන් පෙන්වා දෙන්න.

IV බුද්ධ කාලීන භාරතීය ආගමික හා දාර්ශනික ඉගැන්වීම් අතර බුදුසමයේ සුවිශේෂත්වය පැහදිලි කරන්න.

## [[ 2010/2011 ]] 02 වන ප්‍රශ්නය

I බ්‍රාහ්මණ ආගමික ඉගැන්වීම් අනුව පරම සැපත ලෙස සැලකුණේ කුමක්ද?

II එම සැපත ලබා ගැනීමේ කර්ම මාර්ගය ලෙස සැළකුණු කාර්යයන් නම් කරන්න.

III බ්‍රාහ්මණයන් විසින් ඉදිරිපත් කළ භක්ති මාර්ගය බැහැර කර ඥාණ මාර්ගය තෝරාගත් ශ්‍රමන සම්ප්‍රදායට අයත් ආගමික නායකයන්, ආගමික කණ්ඩායම් හා ආගමික මතවාද පිළිබඳ විස්තරයක් සපයන්න.

IV “ආගමික මතවාදයන්ගෙන් ආකූලත්වයට පත් භාරතීය ජනයාට අත්හළ යුතු අන්ත දෙකත්, ගමන් කළ යුතු මාර්ගයත්, පසක් කළ යුතු සත්‍යයත් බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් සේක.” යන කියමන පැහැදිලි කරන්න.

## [[ 2009/2010 ]] 02 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන ප්‍රකට ජටිල තාපසවරු දෙදෙනකු නම් කර,ජටිල තාපසවරුන්ගේ ආගමික කාර්ය දෙකක් නම් කරන්න.

II බුද්ධ කාලීන පරිබ්‍රාජකවරුන් හෝ පරිබ්‍රාජිකාවන් හතර දෙනෙකු නම් කරන්න.

III අව්‍යාකත ප්‍රශ්න නම් කර,බුදුරඳුන් ඒවාට එක එල්ලේම පිළිතුරු නොදුන්නේ කවර හේතු නිසාදැයි පැහැදිලි කරන්න.

IV “බුද්ධ කාලීන භාරතය ආගමික හා දාර්ශනික වශයෙන් අතිශය සංකීර්ණ තත්ත්වයක පැවතිණි.” කියමන පරීක්ෂාවට ලක් කරන්න.

## [[ 2008/2009 ]] 02 වන ප්‍රශ්නය

I භාරතයේ පැවතුණු ප්‍රධාන යාග හතරක් නම් කරන්න.

II නිගණ්ඨ සාධුවරයන්ගේ ප්‍රභේද දෙක නම් කර, ඔවුන්ට ඒ නම් භාවිත වූයේ කවර කරුණක් නිසා දැයි කෙටියෙන් දක්වන්න.

III නිගණ්ඨ ශාසනයෙහි එන චතුයාම සංවරය සඳහන් කර, නිගණ්ඨනාථපුත්ත ශාස්තෘවරයාගේ ශාසනයෙහි ශාසනික පිළිවෙත් පිළිබඳව විස්තරයක් සපයන්න.

IV “ බුදුරඳුන් පහළ වන සමයේ පැවති විවිධ ආගම් හා දර්ශනවල තිබූ පදනම් විරහිත මතිමතාන්තර සමාලෝචනයට ලක් කළ බුදුසමය ඒවයේ නිස්සාරත්වය හෙළි කළේය.”යන කියමන පැහැදිලි කරන්න.

## [[ 2007/2008 ]] 03 වන ප්‍රශ්නය

I පූර්ණ කස්සප නම් ශාස්තෘවරයාගේ ධර්මය කෙටියෙන් දක්වන්න.

II පරිබ්‍රාජක,අචේලක,ජටිල යන ශ්‍රමණ සම්ප්‍රධායන් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

III බුදුරජාණන් වහන්සේ විසින් එක එල්ලේම විසඳුම් නොදී පසෙක තබන ලද අව්‍යාකත ප්‍රශ්න හතරක් දක්වා, මේවාට එක එල්ලේ පිළිතුරු සැපයීමෙන් වැළකී සිටීමට හේතුවූ කරුණු පැහැදිලි කරන්න.

IV බුදුරඳුන් පහළ වන සමයේ පැවති ආගමික පරිසරය විවිධ දෘෂ්ටිවාදීන් අතර පැවති කළහයක් විය යන කියමන පැහැදිලි කරන්න.

## [[ 2006/2007 ]] 03 වන ප්‍රශ්නය

I මහා තිත්ථායතන සූත්‍රයේ සඳහන් වන දර්ශනවාද තුන නම් කර, එක් එක් දර්ශනවාදයේ මූලික ලක්ෂණ කෙටියෙන් දක්වන්න.

II ෂට් ශාස්තෘවරුන් නම් කර නිගණ්ඨනාථපුත්ත ශස්තෘවරයාගේ ආගමික දර්ශනයේ මූලික ලක්ෂණ දක්වන්න.

III බුද්ධ කාලීන භාරතයේ ආගමික හා දාර්ශනික පසුබිම පිළිබඳ සමාලෝචනයක් කරන්න.

## [[[[[ 2005 ]]]]] 03 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයෙහි පැවති ප්‍රධාන ආගමික සම්ප්‍රදාය දෙකක්වූ බ්‍රාහ්මණ හා ශ්‍රමණ සම්ප්‍රදාය එකිනෙකට වෙනස් වන්නේ කවර ලක්ෂණවලින් දැයි නම් කරන්න.

II ශ්‍රමණ සම්ප්‍රධායට අයත් සේ සැලකෙන මහා ශාස්තෘවරුන් හය දෙනා නම්කර එක් එක් ශස්තෘවරයාගේ දර්ශනය පිළිබඳව කෙටි හැඳින්වීමක් ලියන්න.

III භාරතීය ආගම් දර්ශනවල ස්වභාවය පැහැදිලි කොට බුදු සමය එකී ආගම් දර්ශනවලින් වෙනස් වන්නේ කවර කරුණු නිසා දැයි පහදන්න.

## [[[[[ 2003 ]]]]] 03 වන ප්‍රශ්නය

I අංගුත්තර නිකායේ මහා තිත්ථායතන සූත්‍රයේ සඳහන් භාරතීය දර්ශනවාද තුන නම් කරන්න.

II බුද්ධ ධර්මය මඟින් එකී දර්ශනවාද ප්‍රතික්ෂේප කරමින් ඉදිරිපත් කළ හේතු පැහැදිලි කරන්න.

## [[[[[ 2002 ]]]]] 02 වන ප්‍රශ්නය

I ෂට් ශාස්තෘන් අතුරෙන් කර්මය ප්‍රතික්ෂේප කළ ශාස්තෘන් හතර දෙනා නම් කරන්න.

II කර්ම සංකල්පය ප්‍රතික්ෂේප කිරීම සාමාජ පැවත්මට තර්ජනයක් වන අයුරු පෙන්වා දෙන්න.

### 03 වන ප්‍රශ්නය

I ශස්වත හා උච්ඡේදවාද සැකෙවින් හඳුන්වන්න.

II ශාස්වත හා උච්ඡේද වාදයන්හී අහිතකර සමාජ බලපෑම විස්තර කරන්න.

## [[[[[ 2001 ]]]]] 02 වන ප්‍රශ්නය

I පූර්වාන්ත කල්පිතවාද පස් වර්ගය ලියන්න.

II "සියල්ල පූර්ව කර්මයෙන් සිදු නොවේ." මෙම බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කරන්න.

### 03 වන ප්‍රශ්නය

I බ්‍රාහ්මණ සම්ප්‍රදාය විසින් හඳුන්වා දුන් යාග විධි හතරක් නම් කරන්න.

II බ්‍රාහ්මණික යාගය හා බෞද්ධ දානය අතර වෙනස පෙන්වා දෙන්න.

## [[[[[ 1999 ]]]]] 03 වන ප්‍රශ්නය

I නිගණ්ඨනාථපුත්තගේ ජෛන ධර්මයේ දැක්වෙන චතුයාම සංවරය පිළිවෙළින් නම් කරන්න.

II කාමසුඛල්ලිකානුයෝගය හා අත්තකිලමතානුයෝගය අතරින් වඩාත් අනර්ථකර වන්නේ කුමක්දැයි පහදන්න.

## [[[[[ 1998 ]]]]] 03 වෙනි ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ පැවති ශ්‍රමණ සම්ප්‍රදායන් පහක් නම් කරන්න.

II බ්‍රාහ්මණ සම්ප්‍රදායෙන් ශ්‍රමණ සම්ප්‍රදාය වෙනස් වන්නේ කුමන කරුණු නිසා දැයි පැහැදිලි කරන්න.

## [[[[[ 1997 ]]]]] 02 වන ප්‍රශ්නය

බුද්ධ කාලීන ඉන්දියාවේ ප්‍රචලිතව පැවති ආගමික ඉගැන්වීම් පිළිබඳව විස්තරයක් කරන්න.

## [[[[[ 1996 ]]]]] 03 වන ප්‍රශ්නය

බුද්ධ කාලීන ශ්‍රමණ සම්ප්‍රදායන්හී විශේෂ ලක්ෂණ සැකෙවින් දක්වා ආජීවක සම්ප්‍රදාය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

## 11 වන ප්‍රශ්නය (කෙටි සටහන්)

I –

II අවන්ති ජනපදය

විල්වල ස්බෝලේ හාමුදුරුවෝ